# නිර්ණායක

නිර්ණායක යනුවෙන් මෙම ලේඛනයේ අදහස් කර තිබෙන්නේ ශ්‍රී ලංකාවේ ජාතික උරුමය යනුවෙන් හඳුන්වන හෝ අනාගතයේ දී එසේ හඳුනා ගැනීමට විභවතාවක් ඇති කිසියම් අස්තිත්වයක්, ජාතික උරුමයක් ලෙස ප්‍රකාශ කිරීමේ අභිලාෂයෙන් යෝජනා කිරීම සඳහා මග පෙන්වීමක් කරන උපදේශ මාලාවකි.

## 1. සංස්කෘතික උරුමය

### 1.1. නිශ්චල දේපළ (ස්පෘෂ්‍ය)

නිශ්චල දේපළ යනුවෙන් මෙහි අදහස් කර තිබෙන්නේ අවකාශීය වශයෙන් විතැන් කළ නොහැකි, යම් හෙයකින් කිසියම් අවශ්‍යතාවක් සඳහා ආයාසයෙන් විතැන් කිරීමක් සිදු කළ හොත් හෝ එහි ඓතිහාසික වින්‍යාසය වෙනස් කිරීමකට ලක් කළ හොත් එය සිදු වූ මොහොතේ පටන් එහි අන්තර්ගත ඓතිහාසික සහ සංස්කෘතික අන්තර්ගතයෙන් මිදෙන ආකාරයේ දේපළයි.

#### 1.1.1. වාස්තු විද්‍යාත්මක ස්මාරක

'වාස්තුවිද්‍යාත්මක ස්මාරකයක්' යනුවෙන් මෙහි අදහස් කර තිබෙන්නේ කිසියම් සමාජ කණ්ඩායමක ඓතිහාසික සම්ප්‍රදායට හෝ මෙම ලේඛනයේ සංස්කෘතික උරුමය යනුවෙන් නිර්වචනය කර තිබෙන විෂය පථයට අයත් පුද්ගලයෙකු හෝ සිද්ධියක් සිහිගැන්වීමට භෞතික අවකාශය තුළ දෘශ්‍යමානව ගොඩනගා තිබෙන, කලාත්මක, ඓතිහාසික, තාන්ත්‍රික, තාක්ෂණික හෝ වාස්තු විද්‍යාත්මක අනභිභවනීයත්වය යන ගුණාංග අතුරින් එකක් හෝ කිහිපයක් පැහැදිලි ලෙස පිළිබිඹු කරන අස්තිත්වයකි.

1.1.1-i. ශ්‍රී ලාංකික සංස්කෘතියට ආවේණික වූ දැනුම, කුසලතාව සහ නිර්මාණ කෞශල්‍යයේ විශිෂ්ටතා පිළිබිඹු කරන ස්මාරකයක් වීම

1.1.1-ii. කිසියම් නිශ්චිත කාලපරිච්ඡේදයක දී මානව වටිනාකම් හුවමාරු කර ගැනීම, බෙදා ගැනීම සහ භුක්ති විඳීම පිළිබිඹු කරන වාස්තුවිද්‍යාවේ ආකෘතික, තාක්ෂණික, සෞන්දර්යාත්මක අංග ලක්ෂණවලින් සමන්විත ස්මාරකයක්, නගර සැලැස්මක් හෝ භූමිදර්ශන ආකෘතියක් වීම

1.1.1-iii. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට අයත් දැනට පවතින හෝ අතීතයේ පැවති සුවිශේෂී සංස්කෘතියකට හෝ ශිෂ්ටාචාරයක අනභියෝගී ප්‍රකාශනය පෙන්නුම් කරන ස්මාරකයක් වීම

1.1.1-iv. ශ්‍රී ලංකාවේ සමාජ-සංස්කෘතික පරිණාමය තුළ වැදගත් අවධියක් හෝ යුගයක් පෙන්නුම් කරන ස්මාරකයක් හෝ ගොඩබිම හෝ ජලාශ්‍රිත භූමිදර්ශනයක් වීම

1.1.1-v. ඍජුව හෝ වක්‍රාකාරයෙන් ශ්‍රී ලාංකේය පුරවැසියන්ගේ සංස්කෘතික ප්‍රවේණිය සහ ආගමික උරුමය පිළිබිඹු කරන අද්විතීය ජීවමාන සම්ප්‍රදායක් හෝ සංකල්පයක්, ජන විශ්වාසයක් ප්‍රකාශයට පත් කරන විශිෂ්ට ස්මාරකයක් වීම

### 1.1.2. පුරාවිද්‍යාත්මක ස්ථල (sites)

අතීත කාලයේ ජීවත් වූ මිනිසුන්ගේ චර්යාත්මක ක්‍රියාකාරීත්වයට අයත් හෝ එවැන්නක් පිළිබිඹු කරන කිසියම් භෞමික හෝ ඇළදොළ/ගංගා/මුහුදු ආශ්‍රිත භෞතික අවකාශයක් වන එසේම 1940 අංක 9 දරන පුරාවිද්‍යා ආඥා පනතේ සහ එහි පසුකාලීන සංශෝධන මගින් නිර්දේශිත විධි විධානවලට යටත් වන ස්ථානයකි.

1.1.2-i. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ සංස්කෘතික ප්‍රවේණිය නිරූපණය කරන සාම්ප්‍රදායික ජනාවාසයක් පැවති බිමක්, භූමිපරිහරණය පෙන්නුම් කරන අවකාශයක්, මුහුද/ ගංගා/ඇළදොළ තදාශ්‍රිත භූමිදර්ශනයක් හෝ පරිසරය සමඟ අනෝන්‍ය සබඳතාව පැවැත්වීම තහවුරු කරන වෙනත් අවකාශයක් වීම

1.1.2-ii. ශ්‍රී ලංකාවේ මනුෂ්‍ය පැවැත්මේ ඉතිහාසයට අදාළ සුවිශේෂී චර්යාවක්, විශිෂ්ට බුද්ධිමය ආදේශනයක්, අනභියෝගී සෞන්දර්යාත්මක පරිකල්පනයක් හෝ අද්විතීය තාක්ෂණික භාවිතයක් සංදර්ශනය කළ  අවකාශයක් වීම

1.1.2-iii. 1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනතේ සහ එහි පසුකාලීන සංශෝධනවලින් නිර්දේශිත නියමයන්ට අනුකූලව ඉහත අංක 1.1.2 යටතේ දක්වා තිබෙන සුදුසුකම් සම්පූර්ණ කරන ස්ථානයක් වීම

### 1.1.3 කලාත්මක/ඓතිහාසික අගයකින් යුත් නිර්මිත පරිසරය

නිරීක්ෂණය කරන්නා තුළ ප්‍රසාදාත්මක සංජානනීය හැඟීම් මිශ්‍රිත අගයක් ජනනය කිරීමට සමත් යැයි බහුතරදෙනාගේ විශ්වාසයට, අවධානයට සහ ඇගයීමට ලක් වූ, කිසියම් නිශ්චිත කාලපරිච්ඡේදයක දී එක් පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ කර්තෘත්වයෙන් පරිණතියකට පත්, ශ්‍රී ලාංකිකයින්ගේ ආවේණික චින්තන විධි පැහැදිලිව වටහා ගත හැකි අන්දමේ සාකල්‍ය ප්‍රකාශනයක් මින් අදහස් කෙරේ.

1.1.3-i. කිසියම් කාලපරිච්ඡේදයකට අයත්, සෞන්දර්යාත්මක හැඟීම හා සංවේදී බව ජනනය කරමින් ශ්‍රී ලාංකේය සංස්කෘතිය නිරූපණය කරන උත්කෘෂ්ටතාවෙන් යුත්, නිර්මාණාත්මක සංකල්පනය, පරිකල්පනය, තාක්ෂණික කුසලතාව යන ගුණාංග ඍජුව පෙන්නුම් කරන දෘශ්‍යමය ප්‍රකාශනයක් වීම

1.1.3-ii. ශ්‍රී ලංකාවේ කිසියම් සුවිශේෂී ජනකණ්ඩායමකට අයත් වූ ද, ශ්‍රී ලංකාවේ ජාතික උරුමය යැයි මෙම ලේඛනයේ අංක 1.2 උපශීර්ෂයේ නිර්වචනය කර තිබෙන අදහස යටතට ගැනෙන ප්‍රපංචය තුළ ඔවුන්ගේ නියෝජිතත්වයේ අනභියෝගීත්වය නිරූපණය කිරීමට ඉවහල් වන්නා වූ ද, ස්පෘෂ්‍ය දේපළක් වීම

1.1.3-iii. ඉහත අංක 1.2.3-i. සහ 1.2.3-ii. මගින් විස්තර කර තිබෙන නිර්ණායකවලින් දක්වා ඇති අවශ්‍යතා ආවරණය කරන සහ 1940 අංක 9 දරන පුරාවිද්‍යා ආඥා පනතේ සහ එහි සංශෝධනවල නිර්දේශිත නියමවලට යටත් වන ස්පෘෂ්‍ය දේපළක් වීම

### 1.1.4 කලාකෘති (නිශ්චල)

නිරීක්ෂණය කරන්නා තුළ ප්‍රසාදාත්මක සංජානනීය සංවේදනය මිශ්‍රිත අගයක් ජනනය කිරීමට සමත් යැයි බහුතරදෙනාගේ විශ්වාසයට, අවධානයට සහ ඇගයීමට ලක් වූ ද, කිසියම් නිශ්චිත කාලපරිච්ඡේදයක දී

එක් පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ කර්තෘත්වයෙන් පරිණතියකට පත් වූ ද, ශ්‍රී ලාංකිකයින්ගේ ආවේණික චින්තන විධි සහ සංස්කෘතික සමායෝජනය සංයුක්තව වටහා ගත හැකි, අවකාශීයව විතැන් කළ පසු අර්ථහානියට පැමිණෙන ප්‍රකාශන මින් අදහස් කෙරේ.

1.4-i. ඉහත සඳහන් නිර්වචනයේ ප්‍රකාශිත නියමයන්ට අනුකූල වූ ද, මෙම ලේඛනයේ අංක 1.2.3-i., 1.2.3-ii.සහ අංක 1.2.3-.iii. යටතේ වන වගන්තිවලින් පැහැදිලි කර තිබෙන කිසියම් අස්තිත්වයක්, ප්‍රකාශනයන් හෝ දේපළක් වීම

**1.1.5. සංස්කෘතික භූමිදර්ශන**

කිසියම් නිශ්චිත කාලපරිච්ඡේදයක දී සංස්කෘතිකමය වශයෙන් ප්‍රේරණය වී ඇති, ස්වභාවික ප්‍රභවයක් තිබෙන භෞමික හෝ ජලාශ්‍රිත අස්තිත්වයක් හෝ අවකාශයක් සංස්කෘතික භූමිදර්ශනයක් යනුවෙන් හැඳින්වේ.

1.1.5-i. සංස්කෘතිකමය වශයෙන් සංස්කරණය කළ හෝ ප්‍රේරණය කළ බවට භෞතිකව හෝ දෘශ්‍යමානව සංජානනය කළ හැකි භෞමික හෝ ජලාශ්‍රිත අවකාශයක් වීම

1.1.5-ii. ජාතික අභිමානය, සමාජ සාමග්‍රිය සහ ආගමික සුහදශීලීත්වය අවධාරණය කරන සිද්ධියක් හෝ සිද්ධිමාලාවක් නිරූපණය කරන, නියෝජනය කරන, ඒ බව සනාථ කිරීමට යෝග්‍ය ප්‍රාමාණික වලංගු සාක්ෂි සහිත භෞමික හෝ ජලාශ්‍රිත අවකාශයක් වීම

**1.2. චංචල දේපළ (ස්පෘෂ්‍ය)**

**1.2.1. මානවකෘති**

මානවීය සංස්පර්ශයන් මගින් ප්‍රේරණය කළ පදාර්ථයක් (matter) මානවකෘතියක් යනුවෙන් මෙහි අදහස් කර තිබේ.

1.2.1-i. ශ්‍රී ලංකාවේ මනුෂ්‍ය පැවැත්මේ ඉතිහාසය පිළිබිඹු කරන්නා වූ ද, මිනිසාගේ කර්තෘත්වයෙන් නිර්මාණය කරන ලද හෝ සංස්කරණය කරන ලද හෝ අන් ක්‍රමයකින් මානව අතරමැදිවීම පිළිබිඹු කරන සලකුණු ප්‍රතිෂ්ඨාපනය (human attributes imposed upon) කර ඇත්තා වූ ද, ශ්‍රී ලාංකේය උරුමයේ නිර්මාණශීලීත්වය, පරිකල්පනය, ධී ශක්තිය (power of intellect) සහ ව්‍යවහාරික ඥානය ප්‍රකාශ කරන සර්වකාලීන වැදගත්කමකින් හෝ කිසියම් යුගයකට අයත් විශිෂ්ටතාවක් පිළිබිඹු කරන ද්‍රව්‍යාත්මක ප්‍රකාශනයක් හෝ එවැනි ප්‍රකාශන එකතුවක් වීම

1.2.1-ii. ඉහත අංක 2.2.1.i.වගන්තියේ සඳහන් කරුණු මගින් විස්තර කර තිබෙන අවශ්‍යතා ආවරණය කරන අතර ශ්‍රී ලංකාවේ ඓතිහාසික උරුමය සාධනීය ලෙස තහවුරු කිරීමට සමත් අන්තර්ජාතික සබඳතා නිරූපණය කරන ද්‍රව්‍යාත්මක ප්‍රකාශනයක් හෝ එවැනි ප්‍රකාශන එකතුවක් වීම

**1.2.2. කලාකෘති (චංචල)**

1.2.2-i. ඉහත අංක 1.2.3.i., 1.2.3-ii. සහ 1.2.3.iii.යන ඡේදවල විස්තර කර තිබෙන නියමයන්ට අනුව නිර්වචනය කළ හැකි අවකාශීය වශයෙන් විතැන් කළ හැකි, ප්‍රවාහනය කළ හැකි, හුවමාරු කළ හැකි අන්දමේ ද්‍රව්‍යාත්මක ප්‍රකාශනයක් වීම

### 1.2.3. ඓතිහාසික/සංස්කෘතික ලේඛන

ඓතිහාසික, ආගමික හෝ සංස්කෘතික වශයෙන් ශ්‍රී ලාංකේය අනන්‍යතාව පිළිබිඹු කරන හෝ වාස්තවික ජාතික ස්මරණයක් ලෙස සහ/හෝ ගෞරවයට ලක් වන සිද්ධි, ස්ථාන සහ පුද්ගලයින් පිළිබඳ වැදගත් වන තොරතුරු ඇතුළත් ආලේඛ්‍ය, මුද්‍රිත/අධිලේඛන සහ එවැනි සම්ප්‍රදායකට අයත් ප්‍රකාශන මෙයින් අදහස් කරයි.

1.2.3-i. 1977 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දෙවන පරිච්ඡේදයේ නව වන ව්‍යවස්ථාවෙන් ප්‍රකාශිත නියමයන් මගින් අනන්‍ය නිර්දේශිත සහ අවධාරිත විධිවිධාන ප්‍රකාර එයින් අර්ථවත් වන, ආගම්වලට ලේඛනයක් වීම

1.2.3-ii. යම් ප්‍රජාවකගේ විශිෂ්ට ඓතිහාසික, සමාජීය, සංස්කෘතික හෝ කලාත්මක අනන්‍යතාව පිළිබිඹු කරන හෝ/ සහ ස්මරණය ප්‍රකාශිත ලේඛනයක් වීම.

1.2.3-iii. ශ්‍රී ලංකාවේ මනුෂ්‍ය පැවැත්මේ ඉතිහාසයට අදාළ සුවිශේෂ හෝ දීර්ඝකාලීන ආභාසයක් වූ ඓතිහාසික හෝ සංස්කෘතික සිද්ධියක්, ස්ථානයක්, අත්දැකීමක් හෝ පුද්ගලයෙක් සම්බන්ධයෙන් මූලාශ්‍රය වන මුල් ලේඛනයක් වීම.

1.2.3-iv. ශ්‍රී ලාංකේය සංස්කෘතියේ උත්කෘෂ්ට අනන්‍යතාව ප්‍රකට කරන සම්භාවනීය සාහිත්‍ය පරිකල්පනය, නිර්මාණශීලී ලලිතකලා/ ප්‍රාසංගික කලා/ දෘශ්‍ය කලා සහ ප්‍රභාමූල (photo-based) හෝ විද්‍යුත් ප්‍රකාශනයක් වීම.

1.2.3-v. වර්ෂ 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනත සහ එහි සංශෝධනවලින් නිර්දේශිත නියමයන්ට අනුකූල විධිවිධානවලින් නිර්වචනය කර ඇති ලිඛිත ප්‍රකාශනයක් වීම.

## 1.3. ප්‍රජානන චර්යා සහ සංකල්පන (අස්පෘෂ්‍ය)

### 1.3.1. සාම්ප්‍රදායික සන්නිවේදන ආකෘති

අන්තර් පුද්ගල (interpersonal) සහ අන්තඃ සමාජ (intrasocietal) පරිමාණයෙන් යම් ප්‍රජාවක් සන්නිවේදන අරමුණින්, ප්‍රවේණිගතව පවත්වා ගෙන එන ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාව පිළිබිඹු කරන වාචික සහ නිර්වාචික ආකෘති මෙයින් අදහස් කෙරේ.

1.3.1-i. සමජාතීය සංස්කෘතික කණ්ඩායමක් ලෙස සැලකිය හැකි යම් ප්‍රජාවක් සිය වෘත්තීය, ශිල්පීය, ආගමික හෝ සංස්කෘතික ක්‍රියාවලියක දී භාවිත භාෂා ව්‍යවහාරයක් වීම.

1.3.1-ii. දෛනික ක්‍රියාකාරකම්වල දී සඵලදායී අන්තර් පුද්ගල සන්නිවේදනය උදෙසා භාවිත ප්‍රාදේශීය අනන්‍යතාවෙන් යුතු ජනවහර සම්ප්‍රදායක් වීම.

1.3.1-iii. කිසියම් සංස්කෘතියකට ආවේණික වූ ප්‍රජාවකගේ ව්‍යවහාරයට ඇතුළත් ප්‍රකට හෝ

අප්‍රකට අර්ථ ප්‍රයෝගයක් හෝ භාෂා ප්‍රයෝගයක් වීම.

1.3.1-iv. යම් ප්‍රජාවකට අනන්‍ය වූ එකඟතා, සම්මුති හා සම්ප්‍රදායන් අනුව පවත්නා ජන සම්මත නිර්වාචික සන්නිවේදන ව්‍යවහාරයක් වීම.

### 1.3.2. ප්‍රවේණික වෛද්‍ය ක්‍රම සහ ආදේශන

ප්‍රවේණික වෛද්‍ය ක්‍රම සහ ආදේශන යනු යම් ප්‍රදේශයකට, ජනකොට්ඨාශයකට හෝ පරපුරකට සුවිශේෂී යම් වෛද්‍යමය ව්‍යවහාරයක්, ප්‍රතිකාර ක්‍රමවේදයක්, ඖෂධීය ප්‍රයෝගයක් හෝ චිකිත්සීය යෙදවුමක් හා ඒවායේ උපයෝගීතාව වේ.

1.3.2-i. ශ්‍රී ලංකාවට, එහි යම් ප්‍රදේශයකට, ජන කොට්ඨාසයකට, පරපුරකට ආවේණික හා ඔම සම්ප්‍රදායේ අනන්‍යතාව පිළිබිඹු කරන යම් වෛද්‍යමය දැනුමක් යොදා ගනිමින් නිර්මාණය කළ ව්‍යවහාරයක්, ප්‍රතිකාර ක්‍රමවේදයක්, ඖෂධීය ප්‍රයෝගයක් හෝ චිකිත්සීය යෙදවුමක් වීම

1.3.2-ii. ශ්‍රී ලංකාවට, එහි යම් ප්‍රදේශයකට ආවේණික වූ යම් ඖෂධීය ශාකයක්, වෙනත් පාර්ථිව (mineral), ජාන්තව (faunal) ද්‍රව්‍යයක් ඒකීයව හෝ මිශ්‍රණයක් ලෙස යොදාගනිමින් නිර්මාණය කළ ඖෂධ සංයෝගයක් හෝ ඖෂධ සංස්කරණ විධියක් වීම

1.3.2-iii. ශ්‍රී ලාංකේය වෛද්‍ය සම්ප්‍රදායට සුවිශේෂී වූ හෝ යම් පරපුරකට ආවේණික රෝග නිශ්චය කිරීමේ ක්‍රමයක් හෝ තාක්ෂණික ක්‍රමවේදයක් වීම

1.3.2-iv. ශ්‍රී ලාංකේය දේශීය වෛද්‍ය ක්‍රමයට අයත් යම් මුද්‍රිත ග්‍රන්ථයක්, අත්පොතක් හෝ පුස්කොළ පොතක් වැනි යම් ලිඛිත මූලාශ්‍රයන් වීම

1.3.2-v. යම් වෛද්‍ය පරම්පරාවක් සතු සුවිශේෂී අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සිරිත් විරිත්, බණ්ඩ උරුමය හෝ ගුරුකුල අභිමානය ප්‍රකට කරන සන්නස්, තුඩපත් ආදී යම් ඓතිහාසික ලේඛනයක් වීම

1.3.2-vi. ශ්‍රී ලාංකේය දේශීය වෛද්‍ය ක්‍රමයට අයත් අනන්‍ය ලක්ෂණ ප්‍රකට කරන ජනවෛද්‍ය ක්‍රම හෝ වෙනත් සංස්කෘතිමය ව්‍යවහාරයන් / භාවිතයන් වීම

### 1.3.3. න-ආක්‍රාමී මනෝචිකිත්සක ක්‍රම

මෙහි න-ආක්‍රාමී **(non-invasive)** මනෝචිකිත්සක ක්‍රම යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකාවේ සංස්කෘතික අනන්‍යතාව ප්‍රකට කරන, පරිකල්පනයේ සහ ව්‍යවහාරයේ අනභියෝගී යෙදවුම් ලක්ෂණ සහිත කායික-මානසික ව්‍යාධි ව්‍යුපශමනය කිරීමේ අරමුණින් භාවිත කෙරෙන යාතුකර්මික මනෝචිකිත්සක ක්‍රමෝපායයන් ය.

1.3..3-i. ශ්‍රී ලාංකිකයින්ට ආවේණික සාම්ප්‍රදායික දැනුම, ආකල්ප, කුසලතා හා කලා න්‍යායයන්ගේ ආනුභාව පළ කෙරෙන, නිර්මිත කාල පරිමාවකට සංගෘහිත වූ මානව සමාජයේ ජීවන උද්දීප්තිය අභිප්‍රේත ප්‍රාසංගික ඉදිරිපත් කිරීමක් වීම.

1.3.3-ii. මානසික ආතතීන් සහ පරාරෝපණය වීම් සමනය කිරීමේ අභිමතයෙන් යුතුව කරනු ලබන ජනසංස්කෘතික සංදර්ශන විධියක් වීම

1.3.3-iii. ජීවිතයට බලපවත්වන ස්වභාවික සහ සාමාජයීය අන්තරායන් පිටුදැකීමේ අරමුණින්

සිදු කරන ශ්‍රී ලාංකේය සම්ප්‍රදායික ජනජීවිතයේ සංකල්පනය සහ තර්ක බුද්ධිය පිළිබිඹු කරන ව්‍යවහාරයක් වීම

### 1.3.4. අන්තර්-සංස්කෘතික සහජීවන ආකෘති

චිරාත් කාලයක් අන්‍ය සංස්කෘතික පුරුෂාර්ථ සමඟ අන්තර් ක්‍රියාවෙන් ප්‍රතිගෘහිත වූ සංවේදනය, සහජීවන අභිලාෂයෙන් යුතුව දේශීය ආකෘතියක් තුළ අනුකූලනය/අනුවර්තනය, පරිකල්පනය පිළිබිඹු කරන සංස්කෘතික සම්ප්‍රදායයන් සියල්ල මේ මගින් නිර්වචනය වේ.

1.3.4.1-i. අන්තර් සංස්කෘතික ලක්ෂණ නිරූපිත, එබඳු සංස්කෘතිකාංග සංරක්ෂණය හා පෝෂණයට ඉවහල් වන ව්‍යවහාරයක් වීම.

1.3.4.1-ii. විවිධ සමාජ සංස්කෘතික, ආර්ථික සන්දර්භ තුළ ජීවත්වන ජන කණ්ඩායම් හෝ ප්‍රජාවන් අතර සහජීවනය, සමගිය, සහභාගිත්වය හා සහයෝගය ප්‍රවර්ධනය කරන සාම්ප්‍රදායිකව පවත්වා ගෙන එන සාරධර්ම හා පිළිවෙත් සමුදාය නියෝජනය කරන ව්‍යවහාරයක් වීම.

### 1.3.5. ආහාර සුරක්ෂණ පිළිවෙත්

ආහාර සුරක්ෂණ පිළිවෙත් යනු යම් සමාජයක් වාස්තවිකව හෝ කිසියම් ප්‍රජාවක් ප්‍රවේණිගතව පවත්වා ගෙන එනු ලබන සංස්කෘතික විවිධත්වය පිළිබිඹු කරන අන්නපාන විධි තිරසාරව පවත්වා ගැනීමට භාවිත කළ දැනුම, හෝ ව්‍යවහාර ඇතුළත් යෙදවුම් වේ.

1.3.5-i. ශ්‍රී ලාංකාවට ආවේණික සංස්කෘතිය තුළ සම්ප්‍රදායිකව පවතින්නා වූ ආහාර සංරක්ෂණය, සුරක්ෂණය, පරිරක්ෂණය, සංස්කරණය හෝ පරිභෝජනය ප්‍රකාශිත යම් දේශීය හෝ ප්‍රාදේශීය අනන්‍යතාව සහිත දැනුමක් හෝ භාවිතයක් වීම

1.3.5-ii. ශ්‍රී ලාංකේය ජන ජීවිතය හා ජන සමාජයේ අනාදිමත් කාලයක සිට පැවත එන යම් ප්‍රජාවකට හෝ යම් ජන කොට්ඨාශයකට, අනන්‍ය ආහාර සංස්කරණය, සුරක්ෂණය, පරිරක්ෂණය, සංස්කරණය හෝ පරිභෝජනය සඳහා යොදාගන්නා වූ තාක්ෂණික ව්‍යවහාරයන් හා ආශ්‍රිත මෙවලම් හෝ වෙනත් භෞතික සම්පතක් වීම

1.3.5-iii. ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාව සහිතව ආහාර සංරක්ෂණය, සුරක්ෂණය, පරිරක්ෂණය, සංස්කරණය හෝ පරිභෝජනය හා බැඳුණු සාහිත්‍යමය, චර්යාත්මක, චාරිත්‍රානුකුල හෝ සන්නිවේදනමය ප්‍රකාශනයක් වීම

### 1.3.6. පරිසර කළමනාකරණ ආකල්ප

ශ්‍රී ලංකාවේ පරිසර විවිධතාව සංජානනය කිරීමෙන් එහි පවතින ස්වභාවික සමතුලිතාව, සංස්කෘතික අන්තර්ක්‍රියාවලට සමාන්තරව, ආරක්ෂා කිරීම පවත්වා ගෙන යාම පිණිස සම්පාදනය කළ පරිකල්පන සහ සංකල්ප පදනම් වූ ව්‍යවහාර යෙදවුම් මින් අදහස් කෙරේ.

1.3.6-ii. පරිසර හිතකාමී සහභෝජිත්වයක් පවත්වා ගැනීමේ අරමුණින් සම්මුතිගත කළ පිළිවෙත් ප්‍රවර්ධනය, පවත්වා ගැනීම, භාවිතය සහ ආරක්ෂා කරන චින්තන හා ව්‍යවහාර සම්ප්‍රදායක් වීම.

1.3.6-iii. ඉහත අංක 1.3.6.ii. වගන්තියෙන් ප්‍රකාශිත සම්ප්‍රදායක් අනුප්‍රාප්තික ප්‍රජාවට

තිරසාරව පවරාදීමට අනුගමනය කරන ආකෘතියක් වීම.

### 1.3.7. මානවවිද්‍යාත්මක ස්මරණ

සිය සංස්කෘතික පැවැත්මේ අඛණ්ඩතාව මගින් හෝ කිසියම් නිශ්චිත කාල-අවකාශයක අත්දැකීමක් මඟින් සාර්ව පරිමාණයේ වාස්තවික සමාජ මතකයෙන් ද ආංශුක පරිමාණයෙන් ජනමතකයෙන් ද උරුම කර ගත්, ස්මරණයෙන් සම්ප්‍රේෂණය කරන ප්‍රවේණික දැනුම මින් අදහස් කරයි.

1.3.7-i. සාර්ව වශයෙන් ශ්‍රී ලාංකේය සමාජයේ හෝ ආංශුක වශයෙන් ඊට අන්තර්ගත කිසියම් වෙනත් ප්‍රජා කණ්ඩායමක අඛණ්ඩත්වය, ස්වඅනන්‍යතාව, ජයග්‍රහණ, අත්දැකීම් සහ ප්‍රෞඪත්වයේ ප්‍රකාශනයක් ලෙස ඉදිරිපත් වන ස්මරණයක් වීම

### 1.3.8. ස්වයං ප්‍රකාශන විධි

ස්වයං ප්‍රකාශන විධි යනු ශ්‍රී ලාංකේය සංස්කෘතික ආස්තරණය මගින් කාල-අවකාශීය මානවලට සාපේක්ෂව ප්‍රේරණය කළ, පුද්ගලානුබද්ධ ස්වයංආත්මීය සංවේදන විමෝචනය පිළිබිඹු කරන ග්‍රාහ්‍ය දෛහික (somatic) ප්‍රකාශනයි.

1.3.8-i. පුද්ගලත්වය ප්‍රකාශනය කිරීමේ අරමුණින් සම්පාදිත, ආවේණික සංස්කෘතික මාන පසුබිම් කර, මිනිස් සිරුර වාහකයක් ලෙස භාවිතයෙන් සිදු කරන අවාචික සන්නිවේදනයක් වීම.

### 1.3.9. අන්තර්-පුද්ගල සබඳතා පිළිබඳ එකඟතා

අන්තර් පුද්ගල සබඳතා සමතුලිතව පවත්වා ගැනීම උදෙසා ශ්‍රී ලාංකේය සමාජයේ පවතින දේශීය සම්ප්‍රදායේ බුද්ධි ප්‍රභාව හා ශික්ෂණ සම්පත්තිය පිළිබිඹු කරන සංකේතාත්මක ප්‍රකාශන, අවාචික පිළිවෙත්, ව්‍යවහාර, පුද්ගල හෝ කණ්ඩායම් අභිනය සහ ඊට සමානකම් ඇති සෙසු දේ මෙයින් අදහස් කෙරේ.

1.3.9-i. පුද්ගලමූල පෞරුෂය පිළිබඳ අන්‍යෝන්‍ය ගෞරවය සුරැකීම පිළිබඳ වාචික හා අවාචික ක්‍රියාකාරකමක් වීම

1.3.9-ii. ප්‍රවේණිගත කුටුම්භ සම්ප්‍රදායන්හි මහත්වය පිළිබඳ වූ ජනගෞරවයේ ප්‍රකාශනයක් වීම

1.3.9-iii. ප්‍රකර්ශපූර්ව (ceremonial) ක්‍රියාකාරකම්හි අන්තර්පුද්ගල ඇගැයීම් සම්ප්‍රදායන් පවත්වා ගෙන යාමට උපකාරී වන ව්‍යවහාරයක් වීම

1.3.9-iv. සම්ප්‍රදායික ධර්මයන් (customs) හා සදාචාර ධර්මයන් (manners) පුද්ගල ගෞරවය අභිභවනය නොවන අයුරින් කෙරෙන ප්‍රකාශනයක් වීම

### 1.3.10. සාම්ප්‍රදායික තාක්ෂණික යෙදවුම්

අඩු යෙදවුම් ශක්තියකින් (harness energy) වැඩි ප්‍රතිලාභ ශක්තියක් (harvest energy) උත්පාදනය කිරීමේ අරමුණින් ප්‍රවේණියෙන් පවත්වා ගෙන ආ, ශ්‍රී ලාංකේය සංස්කෘතියේ පරිකල්පනය, බුද්ධිමය ප්‍රභාව සහ සාරය ඇතුළත් ආනුභවික සංගත (empirical compounds), ආදේශන, නිමැවුම් සහ ද්‍රව්‍යමය සංස්කෘතිය මෙයින් අදහස් කරයි.

1.3.10-i. ප්‍රවේණිගත දැනුමක් හෝ දැනුම් පද්ධතියක් යොදාගනිමින් දෛනික ක්‍රියාකාරකම්වල හා ජීවන වෘත්තීන් හි සඵලදායීතාව හා එහි සමාජ-ආර්ථික ප්‍රතිලාභ වර්ධනය කරන විශිෂ්ට භාවිතයක්, යෙදවුමක්, සංරචනයක් හෝ ව්‍යවහාරයක් වීම.

1.3.10-ii.ඉහත අංක 1.3.10-i. වගන්තියේ, යම් භාවිතයක්, යෙදවුමක්, සංරචනයක් හෝ ව්‍යවහාරයක් සඳහා නිර්මාණය කළ කාර්යක්ෂම මෙවලමක්, ඇටවුමක්, උපකරණයක් හෝ නිර්මිත පරිසරයක් වීම.

### 1.3.11-.අවට ලෝකය තේරුම් කිරීමේ ප්‍රවේශ

අවට ලෝකය තේරුම් කිරීම යනුවෙන් මෙහි අදහස් කරනුයේ කිසියම් ජනකණ්ඩායමක් හෝ සමාජයක් සිය ස්වයංපාලනයෙන් පරිබාහිර ගම්‍යතා නිරීක්ෂණය, අර්ථදක්වීම, සන්නිවේදනය සහ ඊට සහභාගී වීම හෝ වෙනත් ආකාරයේ අනුකූලතාවක් දක්වීමට අනුගත වන ප්‍රවේණිගත ඥානය මගින් නිර්දිෂ්ට කළ අනන්‍ය චර්යාත්මක හෝ ද්‍රව්‍යාත්මක ව්‍යවහාර වේ.

1.3.11-i අවට ලෝකය නිරීක්ෂණය කිරීම, විමර්ශනය කිරීම, විස්තර කිරීම, ඉදිරිපත් කිරීම හෝ සහභාගිවීම උදෙසා යම් ප්‍රජාවක්, ජන කණ්ඩායමක් හෝ පුද්ගලයෙක් විසින් අනුගමනය කරනු ලබන, ශ්‍රී ලාංකේය අනන්‍යතාව පිළිබිඹුවන සම්ප්‍රදායික පැහැදිලි කිරීමක්, අවධාරණයක් සහිත ව්‍යවහාරයක් හෝ නිර්මාණයක් වීම.

### 1.3.12. සම්පත් ශස්‍යකරණ සහ පරිහරණ ආකෘති

සම්පත් ශස්‍යකරණ **(harvesting)** හා පරිහරණ **(utilization)** ආකෘති යනු යම් ප්‍රජාවක් අයත් පරිසරය ජීවන අවශ්‍යතා සඳහා සහභෝගීව, තිරසාර පදනමකින් නෙළා ගැනීමේ අරමුණින් සම්පාදනය කළ ප්‍රවේණිගත සංස්කෘතික සාරාර්ථය සහ එහි උපායමාර්ග වේ.

1.3.12-i. ජනජීවිතයත්, පරිසරයත් අතර සමතුලිතතාව පවත්වා ගැනීමටත්, තිරසාර ලෙස ආරක්ෂා කර ගැනීමටත් සම්පාදනය කර ඇති සාම්ප්‍රදායික උපායමාර්ගයක්, ප්‍රජානනයක්, යෙදවුමක් හෝ ව්‍යවහාරයක් වීම.

1.3.12-ii. ස්වභාවික සම්පත් සංරක්ෂණය හා කළමණාකරණය පිණිස උපයෝගීවන්නා වූ ද, තිරසාර සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර එකඟතා සහ ගිවිසුම්වලට අනුගතවන්නා වූ ද සම්පත් ශස්‍යකරණය හා පරිහරණය පිළිබඳ සාම්ප්‍රදායික උපායමාර්ගයක්, ප්‍රජානනයක්, යෙදවුමක් හෝ ව්‍යවහාරයක් වීම.

1.3.12-iii. යම් ප්‍රජාවක් හෝ කණ්ඩායමක් අතර පවතින සම්ප්‍රදායික පදනමක් මත අනුගමනය කරන එකඟතා, සම්මුති හෝ ගිවිසුම් මගින් ප්‍රකාශිත උපායමාර්ගයක්, ප්‍රජානනයක්, යෙදවුමක් හෝ ව්‍යවහාරයක් වීම.

### 1.3.13. අනනුභූතික සහ අතිභෞමික දනුම

අනනුභූතික (transcendental) දනුම යනුවෙන් මෙහි අදහස් කර තිබෙන්නේ ඉන්ද්‍රියගෝචර නොවන අත්දැකීමක් හෝ එවැනි අත්දැකීම් සමුදායයකි. පුද්ගල සහ පුද්ගලාන්තර පරිමාණයෙන් තමා සහ අන්තරීක්ෂය අතර පවත්නා අන්තර් සබඳතාව පැහැදිළි කරන ව්‍යවහාර අතිභෞමික/පාරභෞමික (extra-terrestrial) දනුමයි.

1.3.13-i. කිසියම් ප්‍රජාවක්, සිය සමූහයට අයත් සාමාජිකයින්ගේ කායික/මානසික අසාමාන්‍යතා ව්‍යුපශමනය කිරීමේ අරමුණින් ප්‍රවේණිගතව පවත්වා ගෙන ආ, ශ්‍රී ලංකාවට ආවේණික සංස්කෘතික මාන මත විකාශනය වූ අනනුභූතික සන්නිවේදන ව්‍යවහාරයක්, හෝ යෙදවුමක් වීම

1.3.13-ii. කාල සංජානනය හා සෘජු ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයට ගෝචර නොවන කාලය පුරෝකථනය කිරීම උදෙසා ස්වාභාවික වස්තු අනුසාරයෙන් ගොඩ නගා තිබෙන, නිරාකුල ශ්‍රී ලාංකේය අනන්‍යතාව පිළිබිඹු කරන ප්‍රබන්ධාත්මක සංරචනයක්, චර්යාත්මක සම්මුතියක්, විධිවිධානයක් හෝ ග්‍රාහ්‍ය (perceivable) ප්‍රකාශනයක් වීම.

# 2. ස්වභාවික උරුමය

## 2.1. ජෛව උරුමය

ජෛව උරුමය යනුවෙන් අදහස් කරනුයේ ස්වභාවධර්මය විසින් නිර්මිතව පරිණාමයට භාජනය වූ භූමි දර්ශන, සත්ත්ව, ශාක සහ පාරිසරික පද්ධතීන් වේ.

2.1(අ). ජෛව විවිධත්වය පිළිබිඹු කරන තර්ජිත ශාක විශේෂ

2.1(ආ). ජාත්‍යන්තර රතු දත්ත ලේඛනයේ (IUCN Red List) අඩංගු වන ශාක විශේෂයක් වීම.

2.1(ඇ). ආරක්ෂිත ශාක විශේෂ ලෙස නෛතිකව නම් කොට ඇති දේශිය වශයෙන් තර්ජනයන්ට ලක්ව ඇති ශාක විශේෂයක් වීම.

2.1.(ඉ). වෙනත් යම් ජාත්‍යන්තර ගිවිසුමක් මඟින් වෙළදාම, අපනයනය සීමා කොට ඇති හා තහනම් කර ඇති ශාක විශේෂයක් වීම.

### 2.1.1. ජෛව විවිධත්වය පිළිබිඹු කරන තර්ජිත සත්ව විශේෂ

2.1.1(අ). ජාත්‍යන්තර රතු දත්ත ලේඛනයේ (IUCN red list) අඩංගු වන සත්ත්ව විශේෂයක් වීම.

2.1.1(ආ). ආරක්ෂිත සත්ත්ව විශේෂ ලෙස නෛතිකව නම් කොට ඇති දේශීය වශයෙන් තර්ජනයන්ට ලක්ව ඇති සත්ත්ව විශේෂයක් වීම.

2.1.1(ඇ). වෙනත් යම් ජාත්‍යන්තර ගිවිසුමක් මඟින් වෙළදාම, අපනයනය සීමා කොට ඇති හා තහනම් කර ඇති සත්ත්ව විශේෂයක් වීම.

### 2.1.2. ශ්‍රී ලංකාවට ආවේණික බියෝම

2.1.2(අ). අනන්‍ය ශාක හා සත්ත්ව විශේෂයන්ගෙන් සංගත ඒකකයක් ලෙස හඳුනාගත හැකි භෞමික පරිසර කලාපයක් වීම.

2.1.2(ආ). අනන්‍ය ශාක හා සත්ත්ව විශේෂයන්ගෙන් සංගත ඒකකයක් ලෙස හඳුනාගත හැකි ජලාශ්‍රිත පරිසර කලාපයක් වීම.

2.1.2(ඇ). යම් ප්‍රදේශයකට අනන්‍ය වූ භූ-භෞතික සහ දේශගුණික ලක්ෂණයන්ට අනුරූප වූ ශාක හා සත්ත්ව ප්‍රජාවන් සහිත පාරිසරික ඒකකයක් වීම.

### 2.1.3 .ශ්‍රී ලංකාවට ආවේණික සුවිශේෂි පරිසර නිකේතන

2.1.3(අ). සුවිශේෂි ජෛව විවිධත්වයකින් යුත් වනාන්තර, කැලෑ, පතන් බිම්, තෙත්බිම් හා කඩොලාන පද්ධති

2.1.3(ඇ). ජෛව විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක වටිනාකමකින් යුත් පාරිසරික පද්ධතීන්

## 2.2 භූ භෞතික උරුමය

භූ-භෞතික උරුමයන් වශයෙන් හඳුන්වනුයේ ස්වභාවික, විද්‍යාත්මක සහ ආර්ථික වටිනාකමක් සහිත භූ විද්‍යාත්මක සැකැසුම් ය.

2.2.1(අ). ශ්‍රී ලංකාවට අනන්‍ය වූ භෞතික සම්පතක් වීම

2.2.1(ඇ). ශ්‍රී ලංකාවට ආවේණික වූ පාෂාණ සහ/හෝ ඛනිජ තැන්පතුවක් වීම.

2.2.1 ශ්‍රී ලංකාවේ භූවිද්‍යාත්මක ඉතිහාසය පිළිබිඹු කරන නිදර්ශන

2.2.1(අ). විවිධ භූ යුග නියෝජනය කරන පාෂාණීභූත නිධි සහ/හෝ පාංශු කලාපයක් වීම.

2.2.1(ආ). ගෝලීය ජෛව පරිණාමයේ ශ්‍රී ලංකාවේ භූ සැකැස්ම නිරූපණය කරන පාෂාණීභූත අවසාදිත සහිත ස්ථානයක් වීම

2.2.1(ඇ). ජෛව පරිණාමයේ සුවිශේෂතා ප්‍රකට කරන පාෂාණීභූත අවශේෂ සහ/හෝ තැන්පතු සහිත ස්ථානයක් වීම

## 2.3 ස්වභාවික භෞතික උරුමය

ස්වභාවික භෞතික උරුමයන් යනුවෙන් අදහස් කරනුයේ ස්වභාවික භෞතික වෙනස්කම් වලට කාලාන්තරයක් තිස්සේ භාජනය වීමෙන් නිර්මාණය වූ අනන්‍ය ජෛවීය, පාරිසරික හා සෞන්දර්යාත්මක අංග ලක්ෂණවලින් යුත් පරිසර ඒකකයන් ය.

2.3(අ). භෞතික බලපෑම් නිසා ස්වභාවික තත්ත්ව සුවිශේෂ වෙනස්කම්වලට භාජනය වීමෙන් අනන්‍ය ජෛවීය, පාරිසරික හා සෞන්දර්යාත්මක වටිනාකමකින් යුත් ස්ථානයක් වීම.